# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,573 — 1958 ඔක්තෝබර් 31 වැනි සිකුරාද — 31.10.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස—ඉඩම්

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | 1603 |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 1606 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | 1612 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 1613 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


# ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම

## සබරගමු පළාත

ඉලක්කම : **14,557.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 16 වෙනි දින වූ අඟහරුවාද පෙරවරු 9ට පින්දෙනියේ සංචාරක උසාවි ගොඩනැගිල්ලේ දී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමුව දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ නැගෙනහිර කීරවැලි පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි දහඅටක්.

මුල් සිතියමේ අංක 4,169—වේරගල

| බිම් කැබෙල්ලේ නොම්මරය | ඉඩමේ නම | අයිතිකම් කියා හිටින අයගේ නම | කොයි අන්දමේ ඉඩමක්ද යන වග | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 158 | දෙලේහේනේ වත්ත | ... වේරගල පදිංචි දන්ඔරුවලාගේ උන්ගා සහ තවත් අය | ... වත්ත | ... 0 | 2 | 28 |
| 177 | බෝමලුවේවත්ත ... | ... හේනාදිරන්නැහැලාගේ මුදලිහාමි සහ තවත් අය | ... එම | .... 0 | 3 | 03 |
| 179 | තුන්මන්හන්දියෙවත්ත | ... ඇල්පිටියේ පදිංචි විතාන ආරච්චිලාගේ මුදලිහාමි සහ තව කෙනෙක්, වේරගල පදිංචි හේනාදිරන්නහලාගේ පින්චි අප්පුහාමි | පොල් වත්ත | ... 1 | 0 | 21 |
| 188 | දුම්මලවත්ත ... | ... ගමරාලලාගේ පබිලිස් අප්පුහාමි සහ තවත් අය | ... එම | ... 4 | 2 | 14 |
| 195 | පුහුවල වත්ත ... | ... ඩී. ඇස්. සේනානායකගේ උරුමක්කාරයෝ | ... රබර් | ... 13 | 1 | 36 |


1603—ජේ. ඇන්. බී 8193—940 (10/58)

| බිම් කැබෙල්ලේ නොම්මරය | ඉඩමේ නම | අයිතිකම් කියා සිටින අයගේ නම | කොයි අන්දමේ ඉඩමක්ද යනවග | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 207 | හොරගහවලගාවවත්ත ... | ... වැලිගල්ලලාගේ ඩිංගිරියා ... ... | පොල් වත්ත ... | 0 | 0 | 15 |
| 211 | බාලවීහේන ... | ... වේරගල පදිංචි වැලිගල්ලලාගේ දෙයිසා, වේරගල පදිංචි හේනාදිරන්නහලාගේ සින්චි අප්පුහාමි | එම ... | 1 | 2 | 03 |
| 214 | ගුරුගලේවත්ත ... | ... වේරගල පදිංචි හේනාදිරන්නැහැලාගේ සින්චි අප්පුහාමි ... | එම ... | 0 | 0 | 33 |
| 215 | එම ... | ... වේරගල පදිංචි හේනාදිරන්නැහැලාගේ පින්චි අප්පුහාමි, සියාතුහාමි වෙල් විදනෙ | එම ... | 0 | 2 | 17 |
| 225 | ගල්කොටුව ... | ... විදනෙලාගේ මොහොට්ටි අප්පුහාමි ... ... | වත්ත ... | 0 | 0 | 07 |
| 232 | ඉහලවත්ත නොහොත් පන්වත්ත | ... ආරච්චි පතිරන්නැහැලාගේ බණ්ඩා ... ... | එම ... | 0 | 2 | 24 |
| 235 | නාවලේ හේන ... | ... ආරච්චි පතිරන්නැහැලාගේ මුදලිහාමි ... ... | පොල් වත්ත ... | 1 | 3 | 16 |
| 236 | රත්මල්දෙනියේවත්ත | ... වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ බණ්ඩා, වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ සිරිබරහාමි, වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ මුදලිහාමි, වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ සේදනෝනා, වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ පොඩිහාමි | එම ... | 7 | 3 | 23 |
| 239 | හොරගොල්ල ... | ... වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ මුදලිහාමි, වේරගල පදිංචි ආරච්චිපතිරන්නැහැලාගේ සිරිබරහාමි, වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ බණ්ඩා | එම ... | 3 | 0 | 0 |
| 250 | හොරගහවලගාවවත්ත | ... වේරගල පදිංචි වැලිගල්ලලාගේ රංකිරා ... ... | එම ... | 0 | 1 | 29 |
| 252 | තුනොකින්දවලගාවවත්ත | ... සුදුහකුරුගේ පිංසේතුවා, වැලිගල්ලලාගේ ඩිංගිරියා ... | එම ... | 0 | 2 | 08 |
| 254 | තුනොකින්දවලගාවවත්ත | ... සුදුහකුරුගේ පිංසේතුවා, වැලිගල්ලලාගේ ඩිංගිරියා ... | එම ... | 1 | 0 | 05 |
| 259 | මැදවැරැල්ලේවත්ත ... | ... ආරච්චි පතිරන්නැහැලාගේ සිරිබරහාමි ... ... | වත්ත ... | 0 | 1 | 12 |

තක්සේරු මිල, අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකි වේ.

1958 ඔක්තෝබර් 31 වෙනි දින,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමාගේ කායර්‍යාලයේදීය.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

**ඉලක්කම: 14,558.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමාවිසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1958වේ දෙසැම්බර් මස 10වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට පින්දෙනියේ සංචාරක උසාවි ගොඩනැගිල්ලේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් නීත්‍යනුකරන්ට යෙදෙනවා ඇත:

සබරගමුව දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ නැගෙනහිර කිරවැලි පත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි දහනවයක්.

මුල් සිතියමේ අංක 4,169.—වේරගල

| බිම් කැබැල්ලේ නොම්මරය | ඉඩමේ නම | අයිතිකම් කියාසිටින අයගේ නම් | කොයි අන්දමේ ඉඩමක්ද යන වග | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 86 | බුළුවාමුලවත්ත ... | වේරගල පදිංචි වේරගල ආචාරිගේ හේතුහාමි, ආචාරිගේ ජුවන් නයිදෙ, ආචාරිගේ ඩිංගිරි නයිදෙ | පොල් වත්ත ... | 2 | 3 | 09 |
| 87 | නානවලේහේන නොහොත් මැඩිගස්තැන්න | නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ මුදලිහාමි සහ තවත් අය, නාරන්ගොඩ පදිංචි රණවීර ආරච්චි කැන්නැන්නහලාගේ කිරි බණ්ඩා | වත්ත ... | 1 | 0 | 10 |
| 89 | හිටිනවත්ත ... ... | ආචාරිගේ ඇබිතිඅප්පු, වේරගල පදිංචි වේරගල ආචාරිගේ හේතුහාමි සහ සහෝදරයන් දෙදෙනා | රබර් ... | 1 | 2 | 02 |
| 96 | ගලපල්ලේවත්ත ... | වේරගල පදිංචි හේනාදිරන්නැහැලාගේ පින්චි අප්පුහාමි ... | පොල්වත්ත ... | 3 | 2 | 07 |
| 107 | ගොඩැලේයිවත්ත ... | වේරගල පදිංචි වේරගල ආචාරිගේ හේතුහාමි සහ සහෝදරයෝ, ආචාරිගේ පුංචි නයිදේ, නාරන්ගොඩ පදිංචි නාරන්ගොඩ කන්කානම්ලාගේ සිරිබරහාමි | වත්ත ... | 1 | 2 | 33 |
| 109 | බුළුගහමුලවත්ත ... | ගලපිටමඩ, නාරන්ගොඩ වත්ත බාරේ, ආචාරිගේ අප්පු නයිදෙ ... | වත්ත ... | 0 | 1 | 34 |
| 114 | බඩලේසිවත්ත ... | එම ... ... | එම ... | 0 | 3 | 31 |
| 119 | නුගේවලඹිට ... | වේරගල පදිංචි ගමරාල්ලාගේ පබිලිස් අප්පුහාමි ... | රබර් ... | 0 | 0 | 07 |
| 126 | බඩලේසිවත්ත කහලගොල්ලේ වත්ත ... | ගමරාලලාගේ දවිත් අප්පුහාමි, ආචාරිගේ හේතුහාමි, ආචාරිගේ පුන්චිනයිදෙ, ආචාරිගේ ඇබිති අප්පු ... | වත්ත ... | 1 | 3 | 30 |
| 131 | මාරාවේවත්ත ... | ගමරාලලාගේ පබිලිස් අප්පුහාමි, කන්කානම්ලාගේ උන්ගුරාල ... | එම ... | 2 | 0 | 03 |
| 132 | තුන්මන්හන්දියෙවත්ත නොහොත් මාරගහමුලහේන | නාරන්ගොඩ පදිංචි ගමරාලලාගේ අප්පුසිංඤෝ, නාරන්ගොඩ පදිංචි ගමරාලලාගේ පීටර් සිංඤෝ, නාරන්ගොඩ පදිංචි අකලෙ ලේකම්ලාගේ රං මැණිකා | එම ... | 0 | 2 | 26 |
| 142 | තුන්මන්හන්දියෙවත්ත ... | ගලපිටමඩ, නාරන්ගොඩ පදිංචි ගමරාලලාගේ සියදෝරිස් අප්පුහාමි... | එම ... | 0 | 0 | 13 |
| 143 | එම ... ... | ගලපිටමඩ නාරන්ගොඩ පදිංචි ගමරාලලාගේ සියදෝරිස් අප්පුහාමි, නාරන්ගොඩ පදිංචි ගමරාල්ලාගේ මොහොට්ටි අප්පුහාමි | එම ... | 0 | 1 | 06 |
| 147 | මකුළුගහමුලවත්ත නොහොත් පිල වලවත්ත | වේරගල පදිංචි හේනාදිරන්නහලාගේ බණ්ඩා ... ... | පොල් වත්ත ... | 0 | 3 | 15 |
| 149 | කජුගහමුලවත්ත ... | දන්ඹරුවලාගේ අන්දිරිසා, දන්ඹරුවලාගේ ජුවානිසා ... | එම ... | 1 | 0 | 11 |
| 150 | කන්දෙගේවත්ත ... | හේනාදිරන්නැහැලාගේ සියාතුහාමි ... ... | එම ... | 0 | 3 | 23 |
| 154 | කවුඩුබෝගහමුලවත්ත ... | දන්ඹරුවලාගේ බබා ... ... ... | වත්ත ... | 0 | 1 | 17 |
| 155 | හිටිනවත්ත, සිනියගොල්ලේහේන | දන්ඹරුවලාගේ පුංචි උන්ගා, දන්ඹරුවලාගේ ජෝතියා ... | එම ... | 1 | 3 | 17 |
| 156 | හිටිනවත්ත ... ... | දන්ඹරුවලාගේ පුංචි උන්ගා ... ... ... | එම ... | 1 | 0 | 12 |

තක්සේරු මිල : අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකි වේ.

1958 ඔක්තෝබර් 31 වෙනි දින,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමාගේ කායර්‍යාලයේ දීය.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට

**ඉලක්කම : 14,559.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1958 වේ දෙසැම්බර් මස 9 වෙනි දිනවූ අඟහරුවාද පෙරවරු 9 ට පින්දෙනියේ සංචාරක උසාවි ගොඩනැගිල්ලේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දු කරන්ට යෙදෙනවා ඇත.

සබරගමුව දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ නැගෙනහිර කිරවැලි පත්තුවේ පිහිටා තිබෙන බිම් කැබලි විසි දෙකක්.

මුල් සිතියමේ අංක. 4,169—වේරගල

| බිම් කැබෙල්ලේ නොම්මරය | ඉඩමේ නම | | අයිතිකම් කියා සිටින අයගේ නම | කොයි අන්දමේ ඉඩමක්ද යන වග | | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 10 | ආචාරිගේතැන්න | ... | පි. එච්. තෙලේනිසා ... ... ... | රබර් | ... | 0 1 00 |
| 16 | එම | ... | එම ... ... ... | එම | ... | 2 2 10 |
| 17 | පොල්ගහමඩේවත්ත | ... | නාරංගොඩ පදිංචි ලේකම්ලාගේ පින්චිඅප්පුහාමි, දිප්පිටියේ පදිංචි හේවයලාගේ ගල්ගොඩවත්තේ සයිමා, දිප්පිටියේ පදිංචි හේවයලාගේ ගල්ගොඩවත්තේ ජුවානිසා, ඩී. ඇස්. සේනානායකගේ උරුමක්කාරයෝ | පොල් වත්ත | ... | 1 3 13 |
| 19 | එම | ... | නාරංගොඩ පදිංචි ලේකම්ලාගේ පින්චිඅප්පුහාමි, දිප්පිටියේ පදිංචි හේවයලාගේ ගල්ගොඩවත්තේ සයිමා, දිප්පිටියේ පදිංචි හේවයලාගේ ගල්ගොඩවත්තේ ජුවානිසා, නාරංගොඩ පදිංචි ලේකම්ලාගේ මොහොට්ටිඅප්පුහාමි, ඩී. ඇස්. සේනානායකගේ උරුමක්කාරයෝ | එම | ... | 6 1 29 |
| 27 | ගල්ගොඩේහේන | ... | රුවන්වැල්ලේ, කොටියකුඹුරේ, නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ මුදලිහාමි | පොල් වත්ත | ... | 1 1 23 |
| 28 | එම | ... | ලේකම්ලාගේ රංමැණිකා ... ... ... | එම | ... | 0 3 39 |
| 30 | එම | ... | රුවන්වැල්ලේ, කොටියකුඹුරේ, නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ මුදලිහාමි, නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ පින්චිඅප්පුහාමි | එම | ... | 1 2 29 |
| 32 | දෙඹවේවත්ත | ... | නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ සියාතුහාමි ... ... | එම | ... | 0 0 34 |
| 34 | හරස්හේන | ... | නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ මොහොට්ටිඅප්පුහාමි ... | රබර් | ... | 2 3 05 |
| 38 | රඹුකේවත්ත | ... | වහුම්පුරගේ බබා, හේවයලාගේ ජයතුවා (දැනට පූජකවරයෙක්) ... | පොල් වත්ත | ... | 2 2 10 |
| 41 | එම | ... | එම ... ... ... | එම | ... | 3 0 21 |
| 42 | එම | ... | වේරගල පදිංචි දන්නොරුවලාගේ පින්චි උන්ගා සහ තවත් අය ... | එම | ... | 1 0 11 |
| 46 | හපුගහමුලහේනේවත්ත | ... | වේරගල පදිංචි දන්නොරුවලාගේ පින්චි උන්ගා, ගන්නොරුවලාගේ ජෝතියා | එම | ... | 0 2 05 |
| 48 | එම | ... | වේරගල පදිංචි දන්නොරුවලාගේ පින්චි උන්ගා ... ... | එම | ... | 0 0 27 |
| 49 | එම | ... | වේරගල පදිංචි දන්නොරුවලාගේ පින්චි උන්ගා, ගන්නොරුවලාගේ ජෝතියා | එම | ... | 5 0 14 |
| 50 | කුඹුරගොඩකැල්ල | ... | වී. ඒ. මුදලිහාමි සහ තවත් අය ... ... | එම | ... | 0 0 32 |
| 51 | රඹුකේකුඹුරගොඩවත්ත | ... | වේරගල පදිංචි හේනාදිරන්නහලාගේ බණ්ඩා, වේරගල පදිංචි හේනාදි රන්නහලාගේ මීතුරුහාමි | පොල් වත්ත | ... | 2 0 37 |
| 55 | බදුල්ලගහමූලගේනේවත්ත | ... | වේරගල ආචාරිගේ ඇබිතිඅප්පුගේ උරුමක්කාරයෝ ... | එම | ... | 0 2 32 |
| 57 | එම | ... | එම ... ... ... | එම | ... | 2 1 03 |
| 68 | දෙඹවේවත්ත | ... | නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ පින්චිඅප්පුහාමි, නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ පූන්චප්පුහාමි | එම | ... | 0 1 36 |
| 71 | කවුඩුබෝගහමුලවත්ත | ... | නාරන්ගොඩ පදිංචි ලේකම්ලාගේ පින්චිඅප්පුහාමි ... | එම | ... | 0 0 12 |
| 72 | නානවලේවත්ත | ... | නාරන්ගොඩ පදිංචි රණවීර ආරච්චි තැන්තැන්නහලාගේ කිරි බණ්ඩා... | එම | ... | 1 0 30 |

තක්සේරු මිල, අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකි වේ.

1958 ඔක්තෝබර් 31 වෙනි දින,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමාගේ කායර්‍යාලයේදීය.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

**ඉලක්කම : 14,560.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1958වේ දෙසැම්බර් මස 17 වෙනි දිනවූ බදාදා පෙරවරු 9 ට පින්දෙනියේ සංචාරක උසාවි ගොඩනැගිල්ලේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත.

සබරගමුව දිසාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ නැගෙනහිර කිරවැලි පත්තුවේ පිහිටා තිබෙන බිම් කැබලි දහඅටක්.

මුල් සිතියමේ අංක 4,169—වේරගල

| බිම් කැබෙල්ලේ නොම්මරය | ඉඩමේ නම | | අයිතිකම කියාසිටින අයගේ නම | කොයි අන්දමේ ඉඩමක්ද යන වග | | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 271 | ඇල්ලෙහේනේවත්ත | ... | වේරගල පදිංචි වේරගල ආචාරිගේ බබාහාමි, වේරගල පදිංචි වේරගල ආචාරිගේ අර්නෝලිස්හාමි, වේරගල පදිංචි වේරගල ආචාරිගේ ආවිස්හාමි, වේරගල පදිංචි වේරගල ආචාරිගේ හේමාවතී, වේරගල පදිංචි වේරගල ආචාරිගේ පිරිස්හාමි, වේරගල පදිංචි වේරගල ආචාරිගේ අල්පින් නෝනා, වේරගල පදිංචි වේරගල ආචාරිගේ මෙනියස්හාමි, වේරගල පදිංචිව සිටි වේරගල ආචාරිගේ ඔබියස් හාමිගේ උරුමක්කාරයෝ | පොල් වත්ත | ... | 0 1 20 |
| 315 | මුත්තෙට්ටුහේන්යාය | ... | දිප්පිටියේ පදිංචි කුරුපෙත්තලාගේ නෙලා ... ... | රබර් | ... | 0 1 29 |
| 334 | ගල්ගොඩේහේන්යාය මූලහේන | දෙල්ගහ | වේරගල පදිංචි දන්නොරුවලාගේ රතු උන්ඩියලාගේ අන්දිරිසා, වේරගල පදිංචි දන්නොරුවලාගේ රතු උන්ඩියලාගේ ජුවානිසා, වේරගල පදිංචි දන්නොරුවලාගේ රතු උන්ඩියලාගේ සාමෙලා, වේරගල පදිංචි දන්නොරුවලාගේ රතු උන්ඩියලාගේ ජානිසා | හේන | ... | 0 2 02 |
| 335 | ගෝනමඩේහේන්යාය | ... | වේරගල පදිංචි දන්නොරුවලාගේ තෙලේනිසා, වේරගල පදිංචි දන්නොරුවලාගේ තෙසානිසා, වේරගල පදිංචි දන්නොරුවලාගේ පින්චි උන්ගා | හේන | ... | 0 1 30 |
| 342 | ගල්ගොඩගේන්යාය | ... | තඹදිය පදිංචි දන්නොරුවලාගේ ජුවානිසා ... ... | හේන | ... | 0 1 09 |

| බිම් කැබෙල්ලේ නොම්මරය | ඉඩමේ නම | අයිතිකම කියා සිටින අයගේ නම් | කොයි අන්දමේ ඉඩමක්ද යන වග | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 343 | ගල්ගොඩහේන්යාය | වේරගල පදිංචි දන්නොරුවලාගේ පින්චි උන්ගා | හේන | 0 2 15 |
| 359 | නෙලුවෙහේන්යාය | වේරගල පදිංචි හේනාදිරන්නැහැලාගේ උක්කු බණ්ඩා | කැලෑව සහ හේන | 1 0 28 |
| 367 | තලගහහේන | එම | වත්ත | 1 1 24 |
| 388 | බරවාමඩිත්තේහේන | වේරගල පදිංචි දන්නොරුවලාගේ තෙලේනියා, වේරගල පදිංචි දන්නොරුවලාගේ තෙපානිසා, වේරගල පදිංචි දන්නොරුවලාගේ පින්චි උන්ගා, වේරගල පදිංචි දන්නොරුවලාගේ පුවානිසා | රබර් | 0 3 21 |
| 411 | තලගහහේන | වේරගල පදිංචි හේනාදිරන්නැහැලාගේ උක්කු බණ්ඩා | රබර් | 1 0 00 |
| 424 | බරවාමඩිත්කේහේන | අම්තිරිගල පදිංචි හේවාවසන් මද්දුමරාල්ලාගේ ඇඩ්වින් සිංඤෝ | හේන | 1 1 21 |
| 455 | ගලපල්ලේහේන | වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ මොහොට්ටි අප්පුහාමි | එම | 0 1 00 |
| 460 | එම | වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ ඩිංගිරි බණ්ඩා | එම | 1 0 00 |
| 464 | එම | වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ මොහොට්ටි අප්පුහාමි | රබර් | 0 3 02 |
| 245 | බාලවිහේන | වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ ලොකු මැණිකා, වේරගල පදිංචිව සිටි රාජපක්ෂ ආරච්චිලාගේ උක්කු බණ්ඩාගේ උරුමක්කාරයෝ | පොල් වත්ත | 0 0 36 |
| 478 | බාලවිහේන්යාය | වේරගල පදිංචි ආරච්චි පතිරන්නැහැලාගේ ලොකු මැණිකා, වේරගල පදිංචිව සිටි රාජපක්ෂ ආරච්චිලාගේ උක්කු බණ්ඩාගේ උරුමක්කාරයෝ | පොල් වත්ත | 0 3 04 |
| 382 | ලිනියගොල්ලේහේන | වේරගල පදිංචි දන්නොරුවලාගේ ජානිසා, තඹදිය පදිංචි පාලුමුල්ලලාගේ හේතුවා | රබර් | 1 0 06 |
| 441 | හොරගහවලගාවේහේන | උඩහල්පිට පදිංචි ගල්ලත්රාල්ලාගේ බණ්ඩා, ගලපිටමඩ, නාරන්ගොඩ වත්තේ පදිංචි වැලිගල්ලලාගේ ඩිංගිරා | එම | 0 0 09 |

තක්සේරු මිල, අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකි වේ.

1958 ඔක්තෝබර් 31 වෙනි දින,
ඉඩම් පිළිබඳ කොමසාරිස් තුමාගේ කාර්‍යාලයේදීය.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

---

# ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ තවලගොඩ පිහිටි කොස්ගහකුඹුර යන ඉඩමෙන් අඩි 600 × 14ක පමණ කොටසක ප්‍රමාණය. ඊට මායිම්:—

උතුරට : කොස්ගම ඔය,
නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස (නියර),
දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

අංක : කාඩු සී. 261/ජේ 57 ඇල් ඒ 16

1958 ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

ඇල්එච්/ඒ. 1079.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1954රේ අංක 39 දරණ සංශෝධිත ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ නගර සභා සීමාව තුළ, වෝඩ් නො. 4, පානදුර තොටමුනේ පට්ටිය නමැති ගමේ පිහිටි, කොළඹ–ගාළු පාරේ වරිපනම් නො. 311 හා 313 දරණ එරමුදුගහවත්ත නොහොත් බුළුගහවත්ත නොහොත් ඇටවලදෙනිය නමැති පර්චස් 21.05ක් පමණ ප්‍රමාණය ඇති ඉඩම් කැබැල්ලට මායිම් :—

උතුරට : නෙළුම්මාවත නගර සභා පාර,
නැගෙනහිරට : ඇම්. ඒ. පෙරේරා නෝනා මහත්මියට අයත් කුඩාව පාරේ නල්ලුරුව ගම්පති කොටසේ පිහිටි වරිපනම් නො. 22 හා 24 දරණ පනාගහවත්ත නම් ඉඩම,
දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස හා නෙළුම් උද්‍යානය '' නගර සභාවට අයත් ඉඩම'',
බටහිරට : කොළඹ–ගාළු මහ පාර.

අංකය : ජේ. 57/58 ඇල්පී. 360/ඇල්එච්/ඒ. 1079.

1958 ක්වූ ඔක්තෝබර් මස 3 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

ඇල්එච්/ඒ, 2038.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධනය කරනලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත්, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) කළුතර දිස්ත්‍රික්කයේ පානදුර කොටමුනේ වලපොලපට්ටිය නම ගමේ පිහිටි විතපිටියවත්ත නොහොත් හෙරලියවත්ත නමැති අ. 0, රූ. 1. ප. 0 ප්‍රමාණය ඇති ඉඩමට මායිම් :—

උතුරට : කුරුප්පුමුල්ලේ ඇම්. ටී. පීරිස් ගුනරත්නට අයත් හේන නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩම,

නැගෙනහිරට : වලපොලපට්ටියේ, ඒ. ඇම්. විජේවර්ධන, හෙට්ටිගේමෙන්සො ප්‍රනාන්දු, හෙට්ටිගේ එන්සො ප්‍රනාන්දු යන අයට අයත් මෙම ඉඩමේම කොටස හා කුරුප්පුමුල්ලේ ඒ. එච්. විජේවර්ධනට අයත් මෙම ඉඩමේම කොටසක්,

දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස,

බටහිරට : එගොඩ උයනේ බී. ප්‍රනාන්දුට අයත් හිතපිටියවත්ත නොහොත් හෙරලියවත්ත හා හිතපිටියවත්තේ ගම් සභා පාර.

(2) කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ වලපොලපට්ටිය නම ගමේ පිහිටි හිතපිටියවත්ත නොහොත් හෙරලියවත්ත නම් අ. 0, රූ. 0, ප. 4·5 ප්‍රමාණය ඇති ඉඩමට මායිම් :—

උතුරට : කුරුප්පුමුල්ලේ ඇම්. ටී. පීරිස් ගුනරත්නට අයත් හේන නොහොත් දෙල්ගහවත්ත නම් ඉඩම,

නැගෙනහිරට : වලපොල කුරුප්පුමුල්ල ගම් මායිම හා කුරුප්පුමුල්ලේ ඇන්. සී. ප්‍රනාන්දු හා තවත් අයට අයත් කහටගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නම් ඉඩම,

දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස,

බටහිරට : වලපොලපට්ටියේ ඒ. ඇම්. විජේවර්ධනට අයත් මෙම ඉඩමේම කොටයක්.

අංකය : ජේ. 57/58 ඇල්ජී. 516/ඇල්එච්/ඒ. 2038.

1958 ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

**1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාත ප්‍රාදේශීය ආදයම් කොට්ඨාශයේ උලපනේ ගම්මුලාදෑනි වසමේ, උලපනේ ගමෙහි පිහිටි උලපනේවත්ත නොහොත් බෝගොල්ලේවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 2ක් පමණවූ පහත සඳහන් මායිම් ඇති කොටස:—

උතුරට : ගම්පොළ–නාවලපිටිය ප්‍රසිද්ධ පාර,

නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස,

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස සහ ගම්සභා පාර,

බස්නාහිරට : ගම්සභා පාර සහ ගම්පල–නාවලපිටිය ප්‍රසිද්ධ පාර.

අංක : ජේ 57/58ඊ 644/ඇල්.ඩී./ඒ–27

1958ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

**1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමෙ (සංශොධික) ආඥාපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරී කොටසේ ගිනිගස්මුල්ල ගම්මුලාදෑනි වසමේ පල්ලිමුල්ලේ පිහිටි ප්‍රමාණයෙන්, අක්කරයක් පමණ විශාල ගහඅද්දරවත්ත නොහොත් නෝස්ගස්වලව්වේවත්ත නමැති ඉඩම :—

මායිම් :—

උතුරට : නිල්වලා ගඟ,

නැගෙනහිරට : ගවුතමදස සහෝදර මහතුන්ට අයත් ඉඩම,

දකුණට : මාතර–තංගල්ල ප්‍රසිද්ධ පාර,

බටහිරට : ලං.ග.ම. කායයාලය පිහිටුවා ඇති ඉඩම.

අංකය : ජේ. 57/58 ටී. 314/එල්බී. 2348.

1958 ක්වූ ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : ජේ.57/58 ඊ.297—එල්.බී. 2351.

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි :

මාතර දිස්ත්‍රික්කයේ වැළිගම් කෝරළේ ආදයම් නිළධාරි කොටසතුළ පැලැන ගම් මුළාදැනි වසමේ පැලැන ගමේ පිහිටි ඩිංගිවත්ත නමැති ඉඩමෙන් රූඩ් 3, පර්චස් 7·29ක් පමණ ප්‍රමාණ බිම් කැබැල්ලක්.

ඊට මායිම් :—

උතුරට : ලියනරළගෙවත්ත සහ ගාලෙවත්ත (පාසල් වත්ත),
නැගෙනහිරට : වෙදගෙකොරටුව නමැති ඉඩම,
දකුණට : මුහුදු වෙරළ,
බස්නාහිරට : ඩිංගිවත්තේ ඩී අක්ෂරය දරණ කැබැල්ල.

1958ක්වූ ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : 3/62/4/58/87.

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, පානකඩුව පළාතේ, මකුල්ලේපිටිය නමැති ගමේ පිහිටි මකුල්ලේපිටිය නොහොත් මීගහමුලවත්ත නමැති ඉඩමෙන් අ. 0, රූ. 0, ප. 32ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය:—

උතුරට : මහපිටිය–මකුල්ලේපිටිය ගම්සභා පාර,
නැගෙනහිරට : ආර්. ඩී. ඇම්. බන්ඩා විසින් හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස,
දකුනට : එම ඉඩමේ ඉතිරි කොටස සහ එච්. පී. රන්කිරා විසින් හිමිකම් කියන වර ඉය්වත්ත නොහොත් මාරාගහමුලවත්ත නමැති ඉඩම,
බස්නාහිරට : ආර්. ඩී. ඇම්. බන්ඩා විසින් හිමිකම් කියන මකුල්ලේපිටිය කුඹුර නමැති ඉඩම සහ බී. වයි. ඇම්. රන්හාමි විසින් හිමිකම් කියන මකුල්ලේපිටිය නමැති ඉඩම.

(මෙම ඉඩම, ජේ. වින්සන්ට් පෙරේරා බලයලත් මිනින්දෝරු මහතා විසින් සකස් කරනලද නො. 1,115 හා 14.5.1955 දින දරණ පෞද්ගලික පිඹුරේ බෙදු වෙන්කොට පෙන්වන ලදී)

අංකය : ජේ. 57/58 ඇල් ජී 148.

1958ක්වූ ඔක්තෝබර් මස 4 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා,

---

අංකය : 3/62/4/58/100.

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශය යි**

පහත විස්තර කරන ඉඩම් මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයිද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයිද ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

(1) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, හන්වැල්ල පළාතේ, පහල හන්වැල්ල නමැති ගමෙහි පිහිටි කන්දේහේන නමැති ඉඩමෙන් අ. 0, රූ. 0, ප. 07ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : දැනට තිබෙන ගම්සභා අඩි පාර,
නැගෙනහිරට : එච්. ඇම්. බණ්ඩා සහ තවත් අය හිමිකම් කියන මීගහමුලවත්ත නොහොත් තලගහමුලවත්ත නමැති ඉඩම,
දකුනට : එම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : දැනට තිබෙන ගම්සභා අඩිපාර.

(2) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, හන්වැල්ල පළාතේ, පහල හන්වැල්ල නමැති ගමෙහි පිහිටි මීගහමුලවත්ත නොහොත් තලගහමුලවත්ත නමැති ඉඩමෙන් අ. 0, රූ. 0, ප. 09ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : දැනට තිබෙන ගම්සභා අඩි පාර,
නැගෙනහිරට : එච්. එච්. ඩිංගිරි බණ්ඩා විසින් හිමිකම් කියන ගලහටියාව නමැති ඉඩම,
දකුනට : එම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : එච්. ඇම්. කිරිබණ්ඩා සහ තවත් අය හිමිකම් කියන කන්දේහේන නමැති ඉඩම.

(3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, හන්වැල්ල පළාතේ, පහළ හන්වැල්ල නමැති ගමෙහි පිහිටි ගලහිටියාව නමැති ඉඩමෙන් අ. 0, රූ. 0, ප. 17ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස,
නැගෙනහිරට : එච්. ඇම්. බන්ඩා විසින් හිමිකම් කියන ගලහිටියාව පිල්ලැව නොහොත් වත්ත නමැති ඉඩම,
දකුනට : එච්. ඇම්. බන්ඩා සහ තවත් අය හිමිකම් කියන කුඹුර,
බස්නාහිරට : දැනට තිබෙන අඩි පාර සහ එච්. ඇම්. බණ්ඩා විසින් හිමිකම් කියන මොරගහමුලවත්ත නොහොත් තලගහමුලවත්ත නමැති ඉඩම.

(4) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ, හන්වැල්ල පළාතේ, පහල හන්වැල්ල නමැති ගමෙහි පිහිටි ගලහිටියාව පිල්ලෑව නොහොත් වත්ත නමැති ඉඩමෙන් අ. 0, රූ. 0, ප. 9ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : දනාට තිබෙන අඩි පාර,
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස,
දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස,
බස්නාහිරට : එච්. ඇම්. ඩින්ගිරිබන්ඩා විසින් හිමිකම් කියන ගලහිටියාව නමැති ඉඩම.

අංකය : ජේ 57/58 ඇල් ජී 391.

1958 ඔක්තෝබර් මස 2 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම හා ඉඩම් සංවර්ධන ඇමති.

---

අංකය : ඇල්එච්/බී 171,

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත් 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම නො. ඒ 4,221, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළේ ගොරකගොඩ නැමැති ගම

| කැබලි නො. | ඉඩමේ නම | විස්තර | හිමිකම්කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | පින්දම්මුල්ල ... | බැම්ම ... | ... ගරු පොතුවිල සරණතිස්ස ස්ථවිර, කන්දෙවිහාරය, අලුත්ගම ... | 0 0 19·6 |
| 2. | ඇලිඇස්සකුඹුර ... | එම ... | ... කරන්නගොඩ මුදලිගේ දෙන් ඇල්බට් ජයතිලක, කරන්නගොඩ මුදලිගේ කරෝලිස් ජයතිලක, උඩවෙල, අගලවත්ත | 0 0 15·7 |
| 3. | මාකුඹුර ... | එම ... | ... මහතන්ත්‍රිගේ දියෙස් සිංඤෝ, මාලේවන ආරච්චිගේ බාරොන් සිංඤෝ මාලේවන ආරච්චිගේ පිලික් සිංඤෝ, මාලේවන ආරච්චිගේ අගෝස් සිංඤෝ, උඩවෙල, අගලවත්ත | 0 0 4·1 |
| 4. | පුවක්ගහලියද්ද ... | එම ... | ... දෙන් බ්‍රම්පි රණසිංහ, දෙන් ජේම්ස් රණසිංහ, පින්නගොඩ, අගලවත්ත; වැන්තාව කන්කානම්ගේ ඇග්නස් අප්පුහාමි, ජයලත් ආරච්චිගේ දෝන පොඩිනෝනා හාමිනේ, අගලවත්ත | 0 0 20·0 |
| | | | එකතුව ... | 0 1 20·0 |

ඉහත සඳහන් ඉඩම්වලට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 ක්වූ දෙසැම්බර් මස 9 වැනි දින පූ. භා. 10 ට අගලවත්ත ආදයම් පාලක නිලධාරි කාර්‍යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 ක්වූ දෙසැම්බර් මස 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ක්වූ ඔක්තෝබර් මස 22 වැනි දින,
කළුතර කච්චේරිය.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

අංකය : ඇල්.එච්.බී./163.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමෙ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

අතිරේක නො. 7, අවසාන ගම්සැලැස්ම නො. 78, කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගිර පස්දුන් කෝරළේ ඉත්තපාන නැමැති ගම

| කැබලි නො. | ඉඩමේ නම | විස්තරය | හිමිකම් කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 503 | අම්බලමගාවද්දුව ... | රබර්—අවුරුදු 6ක්, වයසැති රබර් ගස් 38යි. අවුරුදු 12ක් වයසැති මිදිගස් 1යි. අවුරුදු 10ක් වයසැති නාරන්ගස් 1යි | ඇල්. ඇම්. පරණවිතාන මහත්මිය, නො. 26, ගිලාගිරිස් මාවත, බම්බලපිටිය | 0 0 37·4 |
| | | | එකතුව ... | 0 0 37·4 |

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් 16 වැනි දින පූ.භා. 10ට කළුතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 දෙසැම්බර් 9 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958ක්වූ ඔක්තෝබර් මස 23 වැනි දින,
කළුතර කච්චේරිය.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

අංකය : ඇල්.එච්/බී. 105.

**1954 රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්ම නො. 4,215. කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ මුණගම නැමැති ගම

| කැබලි නො. | ඉඩමේ නම | විස්තරය | හිමිකම් කියන අය | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | සොලොම්ගේ කුඹුර | ... බැම්ම | ... එච්. ඒ. මාටින්, එච්. ඒ. රෝබෝ සිංඤෝ, උඩුව, හොරණ... | 0 | 0 | 05·8 |
| 2 | ගොඩපරගහකුඹුර | ... එම | ... කේ. ඩී. ඇස්. ගුණතිලක, කේ. ඩී. ඩී. ගුණතිලක, අමරසිංහ පබිලිස් සිංඤෝ, වයි. යවානිස්, මුණගම, හොරණ ; ඩී. ඇල්. ඩී. ගුණවර්ධන, හාඳුපැල්පොල, හොරණ | 0 | 0 | 10·4 |
| 3 | සූරගේ ඔවිට | ... බැම්ම සහ වාරිමාර්ග ඇල සහිත සොරොව්ව | බී. ඩී. ඇල්. ගුණසේකර, හොරණ ... | 0 | 0 | 28·1 |
| 4 | මිදෙල්ලගොඩකුඹුර නො හොත් මිදෙල්ලගහකුඹුර | එම | ... බී. ඩී. ඇල්. ගුණසේකර, හොරණ ; බී. ඩී. පී. ගුණසේකර, බී. ඩී. සයිමන් සිංඤෝ, මුණගම, හොරණ ; කේ. ඩී. ආර්. ගුණතිලක, ගුරුගොඩ, හොරණ ; පී. ඒ. මෙන්ඩිරිස්, පී. ඒ. ලොකුසිංඤෝ, උඩුව, හොරණ ; ඒ. කරෝහාමි, වැලිකල, හොරණ | 0 | 1 | 02·2 |
| 5 | එම | ... බැම්ම | ... තඹවිටගේ පොරෝලිස්, හොරණ ; බී. ඩී. පී. ගුණසේකර, මුණගම, හොරණ | 0 | 0 | 03·5 |
| | | | එකතුව ... | 0 | 2 | 10·0 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1958ක්වූ දෙසැම්බර් මස 11 වැනි දින පූ.භා. 10ට හොරණ ආදයම් පාලක නිලධාරි කායඨාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958ක්වූ දෙසැම්බර් මස 4 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීම ඇති කරුණුට පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958ක්වූ ඔක්තෝබර් මස 23 වැනි දින,
කළුතර කච්චේරිය.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

ඇල් එච්/බී.7.

**1954 අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම නො. ඒ 4,092. කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පොහොද්දරමුල්ල නමැති ගම.

| කැබලි නො. | ඉඩමේ නම | විස්තරය | හිමිකම් කියන අය | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ලිඳමුලවත්ත | ... පොල් ඉඩම, අවුරුදු 50ක් වයසැති පොල් ගස් 2යි, අවුරුදු 1–10 දක්වා වයසැති පුවක්ගස් 3යි, අවුරුදු 3ක් වයසැති කොහොඹ ගස් 1ක් සහ කම්බි වැටකින් කොටසක්ද වේ | ජී. නිකුලස් ගුණවර්ධන, වීරසිංහ පුංචි නෝන, වීරසිංහ චාලිනා නෝන, ජී. ලොරන්සිනා ගුණවර්ධන, පොහොද්දර මුල්ල, වාද්දුව | 0 | 0 | 06·0 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් 23 වැනි දින පූ.භා. 11ට කළුතර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958 දෙසැම්බර් 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958ක්වූ ඔක්තෝබර් මස 24 වැනි දින,
කළුතර කච්චේරිය.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි කොත්මලේ ආදයම් පාලක නිලධාරි තුමාගේ කොට්ඨාශයෙහි පල්ලෙපනේ කෝරලේ, රන්වන්තලාව නම් ගම්මානයෙහි පිහිටි මූලික ගම් මැනීමේ සිතියමෙහි ඒ. 2541, ලොට් 1 සහ 2 දරණ බිම් කැබැලි.

| කැබැල්ල | ඉඩමේ නම | අයිතිකරුවන්ගේ නම් | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|
| 1 | වදවල හේන | ... ඇම්. කේ. මුදලිහාමි, මෝරපේ, මාස්වෙල ... | 0 | 0 | 04·2 |
| 2 | වදවල හේන | ... කළුබෝ ගෙදර මුදියන්සේ, කඩදෙර, මාස්වෙල ... | 0 | 0 | 02·5 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 ක්වූ දෙසැම්බර් මස 6 වැනි දින පූ.භා. 10ට මෝරපේ බෝධිමල්කාරාමය බන මඩුවේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958ක්වූ නොවැම්බර් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958ක්වූ ඔක්තෝබර් මස 24 දින,
නුවරඑළිය කච්චේරියේදීය.

තිස්ස දේවේන්ද්‍ර,
ප්‍රාදේශීය ඉඩම් නිලධාරි තැන, නුවරඑළිය.

---

## 1954 රේ අංක 39 දරණ (සංශෝධිත) ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ (සංශෝධිත) ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වෙනි වගන්තිය (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :—

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති තුමාගේ අදහස පරිදි ඔහු විසින් 1954.10.1 දින අංක 10,720 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 5 දරණ ආඥපනත යටතේ 1954.9.2 දින අංක ජේ 54 ටී. 47 දරණ නිවේදනය අනුව—

නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ආදායම් පාළක නිලධාරි තැනගේ කොට්ඨාශයෙහි දියතිලක කෝරලයෙහි හඟුරංකෙත නගරයෙහි (උඩමුලුව) යටි හඟුරන්කෙත හා හරක්ගම ගම්මානයන්හි පිහිටි මූලික ගම් මැණීමේ සැලැස්මේ ඒ 2,442 දරණ ලොට් 2,3,6,7,8,9 සහ 13 වන ඉඩම් කැබලි

| ලොට් අංකය | ඉඩමේ නම | විස්තර | අයිතිවාසිකම් දක්වන්නාගේ නම | ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2 | හඟුරංකෙත වත්ත ... | ස්ථිර ගොඩනැගිල්ලක් ඇති මඩු බිම හා ප්‍ර.වැ.දෙ. පාරෙන් කොටසක් | ආර්. ඒ. ඇස්. ද සොයිසා, කාසන් කම්බර්බත් සහ සමාගම බාරේ, තැ.පෙ. 24, කොළඹ | 0 | 1 | 16·2 |
| 3 | එම ... | අවුරුදු 30–40 දක්වා පැරණි තේ, අවුරුදු 30–40 දක්වා පැරණි ගස් 45කින් යුත් පොල් වත්ත, අවුරුදු 30–40 දක්වා පැරණි කුඹුරුයාය හා පොල් ගස් 2 සහ ප්‍ර.වැ.දෙ. පාරෙන් කොටසක් | එම | 5 | 2 | 7·4 |
| 6 | පෙරුම්බොඩ ගෙදර ඉඩම ... | වගාවක් නැති වත්ත ... | පෙරුම්බොඩ ගෙදර ඩිංගිරිය, පෙරුම්බොඩ ගෙදර සුබියා, පෙරුම්බොඩ ගෙදර කිරිපුංචා, හරක්ගම, හඟුරන්කෙත | 0 | 0 | 00·9 |
| 7 | පොත්ගුල්විහාරෙවත්ත ... | එම ... | පොත්ගුල්විහාරෙ, හඟුරන්කෙත ; මහා භාරකරු පී. බී. අත්තනායක | 0 | 0 | 00·8 |
| 8 | අඹගහවත්ත ... | කොස් ගස් 2 හා අඹ ගස් 1 සහිත (අ. 15–20) වත්ත | පෙරුම්බොඩ ගෙදර කිරි උක්කුවා, හරක්ගම, හඟුරන්කෙත | 0 | 0 | 01·5 |
| 9 | පොත්ගුල්විහාරෙ වත්ත ... | අවුරුදු 5–6 දක්වා පැරණි කෝපි පැල 2 සහිත වත්ත | පොත්ගුල් විහාරෙ, හඟුරන්කෙත ; මහා භාරකරු පී. බී. අත්තනායක | 0 | 0 | 00·3 |
| 13 | හඟුරන්කෙත වත්ත ... | අවුරුදු 30–40 දක්වා පැරණි කුඹුරුයාය හා තේ වත්ත සහ ප්‍ර. වැ. දෙ. පාර | ආර්. ඊ. ඇස්. ද සොයිසා, කාසන් කම්බර්බත් සහ සමාගම බාරේ, තැ. පෙ. 24, කොළඹ | 8 | 2 | 15·7 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් මස 8 වැනි දින පූ. භා. 10ට හඟුරන්කෙත තානායම් පොලේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 දෙසැම්බර් මස 1 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 ඔක්තෝබර් 24 වැනි දින
නුවරඑළියේ දිසාපති කාර්යාලයේදීය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි තැන, නුවරඑළිය දිස්ත්‍රික්කය.

---

ඇල් ඩී 7569.

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව්, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙ යටතේ දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බස්නාහිර ගිරුවා පත්තුවේ, මුල්කිරිගල ගමේ, 241 අවසාන ගම් සිතියමේ, 4 අතිරේකයට අයිති මෙහි විස්තර සඳහන් ඉඩම.

| ලොට් | නම | වගාව යනාදිය | බිම්තරම අ. | රූ. | ප. | වෙනත් තොරතුරු | අයිතිකරු |
|---|---|---|---|---|---|---|---|
| 237 | මානගෙහේන ... | අවුරුදු 35ක පොල් ගසක් ඇති පොල් ඉඩම | 0 | 0 | 04·7 | ... ලොට් 34න් කොටසක් (වීපී 306704) | මුල්කිරිගල පදිංචි, බමුනුමුල්ලෙ විතානගේ දෙන් වාල්ස් මයා. |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් මස (5) පස්වැනි දින දවල් 12 වේලාවට මුල්කිරිගල ආණ්ඩුවේ පාසැලේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958 නොවැම්බර් 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

1958 ක්වූ ඔක්තෝබර් මස 19 වැනි දින,
හම්බන්තොට කච්චේරියේදීය.

වී. සිවඥනම්,
හම්බන්තොට පළාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

යොමු අංකය : ඇල්ඒ. 3596.

**1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධික) ආඥපනතින් සංශොධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**7 වෙනි වගන්තිය යටතේ වූ දන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

අංක ඒ 1,525 දරණ මූලික සැලැස්ම. ගම් : උල්ලුක්කාපලම් සහ මන්වාඩි

| කට්ටි අංකය | ඉඩමේ නම | විස්තර | හිමිකම්පාන්නාන්ගේ නම් | වපසරිය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1. | පනයාඩි වෝලාඩි | ... දිය කඩිත්තක් සහ පොල් අතු වලින් සෑදූ පැල්පතක්ද, අවුරුදු 50කට අධික වයසැති පොල් ගස් කීපයක් සහිත සමතලා කැලෑවක් සහ අවුරුදු 50 ට වැඩි පරණ පොල් වත්තක් | පුත්තලමේ, ඊ. ඇස්. ඇම්. කායිම් මරික්කාර්, ඊබ්‍රහිම් නයින මරික්කාර්ගේ භාර්‍යාව වූ සාරා උම්මා, ඇම්. එච්. ඇම්. නයින මරික්කාර්ගේ භාර්‍යාව වූ රාලියා උම්මා සහ බොරල්ලේ අග්‍රාජගුරු ප්‍රසාදීන්ගේ දෙව්මැදුරේ, සී. ඇම්. මුතුකුමාරු පියතුමා | 48 3 24 |
| 2. | එම | පොල් ගස් කීපයක් සහිත සමතලා කැලෑවක් ... | එම ... ... ... | 16 2 36 |
| | | | එකතුව ... | 65 2 20 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958 දෙසැම්බර් මස 3 වැනි දින පූ. භා. 10 ට **කච්චේරියේ** දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1958වේ නොවැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

1958 ඔක්තෝබර් මස 17 වැනි දින,
පුත්තලමේ කච්චේරිය.

ආ. සී. නවරත්නරාජා,
ආණ්ඩුවේ ඒජන්තතැන, පුත්තලම් දිස්ත්‍රික්කය.

---

අංකය : එල්.එම්.5687.

**1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමෙ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**7 වැනි වගන්තිය යටතේ වූ දන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැවි 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමෙ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමෙ ආඥපනතේ 7වැනි වගන්තියයේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

සැලැස්මේ අංකය : පී.පී.ඒ. 924—ගම : තිබ්බුටුමුනුව

| බිම් කට්ටි අංකය | ඉඩමේ නම | ඉඩමේ විස්තර | අයිතිකම කියන්නා | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගොයියාවත්ත කුඹුර | ... කුඹුර | ... කෑගල්ලේ, ඩී. කේ. ස්ටීවන් පෙරේරා | ... 0 1 00·9 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1958ක්වූ දෙසැම්බර් මස 17 වැනි දින පූ. භා. 10ට කෑගල්ලේ කච්චේරියේ දී මා සම්මුඛවිය යුතුයි.

තවද 1958ක්වූ දෙසැම්බර් මශ 10වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

වර්ෂ 1958ක්වූ ඔක්තෝබර් මස 24 දින,
කෑගල්ලේ කච්චේරියේදීය.

එල්. බී. හුලන්ගමුව,
දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

# ඉඩම් සංවර්ධන ආඥපණත යටතේ දන්වීම්

## මධ්‍යම පංති ක්‍රමය යටතේ ඉඩම් ලැබීමට සුදුස්සන් තේරීම සඳහා ඉඩම් කච්චේරි දනුම්දීමයි

ඉඩම් සංවර්ධන ආඥපනතේ පහත විස්තර දක්වෙන ඉඩම් ලැබීමට සුදුස්සන් තේරීම සඳහා පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමා විසින් පුත්තලම් කච්චේරියේදී ඉඩම් කච්චේරියක් පවත්වන බව මෙයින් දනුම් දෙනු ලැබේ. ඉඩම් කච්චේරිය පවත්වන දිනය හා වේලාව ඉල්ලුම්කරුවන්ට යථා කාලයේදී දන්වනු ඇත.

**2.** පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචි හෝ ස්ථිර අයිතිවාසිකම් **ඇති** මධ්‍යම පන්තියේ **ලාංකිකයන්ට** ඉල්ලීම් සීමාවේ. අඩුවශයෙන් **අවුරුදු 10ක් පදිංචිය තිබිය යුතුයි.**

3. ඉඩම් සංවර්ධන ආඥපනතේ 171 වෙනි වගන්තිය මධ්‍යම පන්තියේ ලාංකිකයා පහත දක්වෙන අයුරු වර්ග කරයි :—

"යම්කිසි දිනකට කලින්වූ මාර්තු මස 31 වෙනිදයින් අවසන්වන තක්සේරු වර්ෂය වෙනුවෙන් ආදයම් බදු ආඥපනත යටතේ ගණන් බලන ලද යමකුගේ ව්‍යවස්ථාපිත ආදයම රුපියල් දෙළොස් දහසකට වැඩිවේ නම් ඔහු එදින මේ ආඥපනත සම්බන්ධයෙන්, මධ්‍යම පන්තියේ ලාංකිකයකු වශයෙන් ගණන් නොගත යුතුයි. එහෙත් —

(1) ස්ත්‍රී පුරුෂයන් සම්බන්ධයෙන් නම්, ස්ත්‍රීගේ හෝ පුරුෂයාගේ ව්‍යවස්ථාපිත ආදයම ආදයම් බදු ආඥපනතේ 22 වෙනි වගන්තියේ විධාන යටතේ විධිවූ පරිදි නිකුත් කරන නොතීසියේ ප්‍රකාර වෙන වෙනම තක්සේරු කරන මෙන් ඉල්ලා කරවා ගන්නාක් මෙන් සලකා ගණන් බැලිය යුතුයි.

(2) බලයලත් උසාවියක් නඩු තීන්දුවකින් දික්කසාද නොවූ හෝ විධිවූ පරිදි ලියනලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ වෙන් වෙන්ව වාසය නොකරන්නාවූ ස්ත්‍රී පුරුෂයන් දෙදෙනෙකුගෙන් එක් කෙනෙකුවත් ඔවුන් දෙදෙනාගේම ව්‍යවස්ථාපිත ආදයම් එකට එකතු කළ මුළු ගණන රුපියල් විසිහතර දහසට වැඩි වුවහොත් මේ ආඥාපනත සම්බන්ධයෙන් මධ්‍යම පන්තියේ ලාංකිකයකු වශයෙන් සැලකිය යුතු නොවේ.

4. ඉල්ලුම්පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. කවරයේ වම් කොනෙහි '' ගල්කුලිය රක්ෂිත වනයේ මධ්‍යම පන්ති ඉඩම් සඳහා ඉල්ලීම '' යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන නියමිත ෆෝර්මයට අනුව විය යුතුයි.

5. තෝරාගත් ඉල්ලුම් කරුවකුට ඉඩම් අක්කර 10ය බැගින් භාරදෙනු ලැබේ. ඉඩම භාරගෙන අවුරුද්දක් ඇතුළතදී ඉල්ලුම්කරු විසින් මුළු අක්කර 10ය සම්පූර්ණයෙන්ම එළිකොට, ගිනිදමා, වැටකඩලු බැඳ, එහි පොල් හෝ වෙනත් ආර්ථික වැවිලි වගා කිරීම බලාපොරොත්තු වේ. ඉන්පසු ඔහු විසින් වැවිලි සියල්ලම හොඳින් පවත්වාගෙන යා යුතුයි.

6. සෑම ඉල්ලුම්පත්‍රයක්ම 1958 දෙසැම්බර් 30 වෙනි දින හෝ ඊට ප්‍රථම පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමාට ලැබිය යුතුයි.

7. ඉල්ලුම් කරුවන්ට ඉඩම් කච්චේරියේ දිනය හා වේලාව දැනුම් දුන්පසු, සෑම ඉල්ලුම් කරුවෙකුම තමාම හෝ තමා වෙනුවෙන් පත්කළ කෙනෙකු හෝ ඉඩම් කච්චේරියේදී ඉදිරිපත් විය යුතුයි. එසේ ඉල්ලුම්කරු හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටීමට පත්කළ කෙනකු ඉඩම් කච්චේරියට නො පැමිණියේ නම් ඉල්ලුම්කරු තමාගේ ඉල්ලීම් වැඩිදුරටත් කරගෙන යෑමට නොකමැති බව ආණ්ඩුවේ ඒජන්ත තුමා ඒත්තු ගන්නවා ඇත.

8. මේ ඉඩම් කච්චේරිය පිළිබඳ විමසීම් පුත්තලමේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත යැවිය යුතුයි.

9. ඉල්ලුම් පත්‍රයෙහි යම් වැරදි කරුණක් අඩංගුකර තිබේනම්, එය ඉල්ලුම් මුලින් ප්‍රතික්ෂෙප කිරීමට හෝ තෝරාගතහොත් ඒ තේරීම අවලංගු කිරීමට හේතුවනවා ඇත.

10. බෙදදීමට තිබෙන ඉඩමෙහි විස්තර—

කීරියන්කල්ලිය, ආඩිගමපාර මායිම්ව පිහිටි ගල්කුලිය රක්ෂිත වනයෙන් ඉඩම් අක්කර 1,500ක් පොල් වගාවට සුදුසු අක්කර 10යේ කැබලි.

ඒ. ඇස්. නවරත්න රාජා,
ආණ්ඩුවේ ඒජන්ත තැන,

කච්චේරිය, පුත්තලම,
1958 ඔක්තෝබර් 17 දින දීය.

**ඉල්ලීම් ෆෝර්මය**

1. ඉල්ලුම්කරුගේ නම : ————.
2. ලිපිනය : ————.
3. වයස : ————.
4. නඩත්තුවන අය : ————.
5. රක්ෂාව : ————.
6. වාර්ෂික ආදයම (අන්තිම ආදයම් බදු වාර්තාව තිබෙනම් එය අමුනන්න) : ————.
7. ඉඩම් සංවර්ධන කිරීමට ඉල්ලුම් කරු ලඟ වැය කිරීමට ඇති මුදල: ————.
8. ඉල්ලුම් කරුට හා ඔහුගේ භාර්‍යාවට අයිති දේපල (ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඇති ඉඩම්ද ඇතුළු බදු දේපල ඇතුළත් කළ යුතුයි) :————.

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඇල්. ජේ. 1187.

## ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ 21 (2) වැනි ආණ්ඩුවේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

යාපනය දිසාවේ පච්චිලාපලෙයි–කරාච්චි ආදයම් පාලක නිළධාරි තැනගේ කොට්ඨාශයේ, පරන්තන් නම් ග්‍රාමයේ, පරන්තන් කාඩු නැමැති අක්කර 2ක් පමණ විශාල වූ රජයේ ඉඩම් කැබැල්ල, කුමරපුරම්, පරන්තන්, කුමාර් දේවාල සංවර්ධන සමිතියේ භාරකරුවන්වන මුරුගා සින්නතම්බි, වයිරව්පිල්ලෙයි සින්නතම්බි, සින්නතම්බි රාමු, සින්නයියා කණපති පිල්ලෙයි, සහ කතිරවේලු සිදම්පර පිල්ලෙයි යන අය විසින් එහි තැනීමට යන කුමාර් පන්සල සඳහා මුලස්ථානම් හා මූතල මාන්ඩපන් සෑදීම සඳහා බද්දට ඉල්ලා තිබෙන බව මෙයින් නිවේදනය කරමි.

2. මෙකී ඉඩමට උතුරින් 69වන ඉඩම් කැබැල්ලද, දකුණින් මාවතද, නැගෙනහිරින් පරණ පූනරියන් පාරද, බටහිරින් නායි ආරුද මායිම් වී ඇත.

3. පරන්තන් ගම් පුලුල් කිරීමේ ව්‍යාපාරය යටතේ වූ, ඉඩම් කැබලි කිරීමේ සිතියමේ, මෙම ඉඩම මේ කරුණ සඳහා වෙන් කොට තිබෙන්නකි. 500ක් පමණ වූ හින්දු භක්තිමතුන්ට මෙය ප්‍රයෝජනවත් වනු ඇත. මේ හේතුවෙන් ආණ්ඩුවේ හෝ ග්‍රාමීය හෝ උවමනාවන්ට හානි නොපැමිණේ. එබැවින්, රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන්, පහත සඳහන් කොන්දේසිවලටද, යටත් කොට, ඉහත කී ඉඩම බදු දීමට රජය අදහස් කර තිබේ :—

(අ) කාලය : අවුරුදු 99යි.
(ඉ) බද්ද: අවුරුද්දකට රු. 10 යි.
(උ) බදුගන්නන් විසින් බද්ද ආරම්භ වී තුන් අවුරුද්දක් ඇතුලත දී මෙකී ඉඩමෙහි යාපනයේ දිසාපති තැනගේ සිත්ගන්නා පරිදි හින්දු පන්සලකට අවශ්‍ය ගොඩනැගිලි සාද නිම කළ යුතුයි.
(එ) බදුගන්නන් විසින් මෙකී ඉඩම හින්දු පන්සලක් ගොඩනැංවීම සඳහා මිස අන් දෙයකට නොයෙදවිය යුතුයි.

4. මෙහි සඳහන් දින සිට, සති 6ක් ඇතුළත දී, මෙම ඉඩම බදුදීමට විරුද්ධව පිළිගැනෙන හේතු මාවෙත ලියා ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

1958 ඔක්තෝබර් මස 31 වෙනි දින,
කොළඹදීය.

ටී. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

ඇල්. ජේ. 1366.

## 21 (2) වැනි ආණ්ඩුවේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

යාපනේ අතිගරු රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින්, රෝමානු කතෝලික පල්ලියක් ඉදිකිරීම සඳහා, වවුනියා දිස්ත්‍රික්කයේ, චේමමදු ව්‍යාපාරයෙහි ප්‍රජා මධ්‍යස්ථානයක් සඳහා වෙන් කොට ඇති ප්‍රදේශයෙන්, අක්කර 1ක් පමණ වූ භූමිභාගයක් බද්දට දෙන ලෙස ඉල්ලා ඇති බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

2. ළඟම තිබෙන කතෝලික පල්ලිය පිහිටා ඇත්තේ මෙම ස්ථානයේ සිට සැතපුම් 5½ක් ඈතින්ය. ව්‍යාපාරයෙහි දක්ෂිණ තීරයෙහි පදිංචි රෝමානු කතෝලික පවුල් 29ක ආධ්‍යාත්මික අවශ්‍යතාවන් මෙම යෝජිත පල්ලියෙන් පිරිමැසේ. මේ සඳහා දීමට ඉඩම තිබේ. මේ ඉල්ලීම පරිදි, පහත සඳහන් කොන්දේසි සහ අනිකුත් කොන්දේසිවලටද යටත් කොට, ඉඩම බදු දීමට රජය අදහස් කරයි :—

(අ) කාලය : අවුරුදු 99.
(ආ) බද්ද : අවුරුද්දට රු. 1·00.
(ඇ) බදුකරු විසින්, බද්ද ආරම්භ වන දිනයේ සිට අවුරුද්දක් ඇතුලත, මේ ඉඩමේ වවුනියාවේ දිසාපති තුමාගේ සිත්ගන්නා පරිදි, පල්ලියක්, පූජක නිවාසයක්, රැස්වීම් ශාලාවක් සහ ඉරුදින පාසැලක් සඳහා ගොඩනැගිල්ලක් ඉදි කළ යුතුයි.
(ඈ) බදුකරු විසින් මේ ඉඩම රෝමානු කතෝලික පල්ලියක් සහ (ඇ) ඡෙදයෙහි සඳහන් කටයුතු වලට මිස අන් කිසි කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

3. මෙහි සඳහන් දින සිට සති 6ක් ඇතුලත මෙම ඉඩම් කැබැල්ල නොදිය යුතු බවට සෑහෙන හේතු ලියා මාවෙත ඉදිරිපත් නො කළහොත්, මේ ඉල්ලීම අනුව ඉඩම බදු දෙනු ලැබේ.

1958 ඔක්තෝබර් මස 31 වෙනි දින,
කොළඹදීය.

ටී. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී